නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,
අපද්‍රව්‍ය බැහැරලීම් සහ
ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

# නාගරික සංවර්ධන අධිකාරිය

## ඇබෑර්තු

පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද සහිත අය විය යුතුය.

### ඒ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා)

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පිළිගත් ප්‍රථම (විශේෂ) උපාධියක්

  සහ

  ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකත්වය ලබා තිබීම

  සහ

  සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ, කළමනාකරණ ප්‍රභේදයේ වසර පහක් (05) ඇතුළුව අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද

රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි සේවා සහ ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග පිළිබඳ පළපුරුද්ද සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවනු ඇත.

**වැටුප් පරිමාණය :** මධ්‍යම කළමනාකාර මට්ටම - MM 1-1 - 2016 ශ්‍රේණිය I

**මාසික වැටුප :** ආසන්න වශයෙන් රු. 104,000/-

### බී. නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ)

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ ප්‍රථම (විශේෂ) උපාධියක්

  සහ

  පිරිස් කළමනාකරණ ආයතනයේ ආයතනික සාමාජිකත්වය ලබා තිබීම

  සහ

  අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ ප්‍රභේදයේ වසර පහක් (05) ඇතුළුව අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද

  හෝ

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ ප්‍රථම (විශේෂ) උපාධිය

  සහ

  මානව සම්පත් කළමනාකරණය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

  සහ

  මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ කළමනාකරණ ප්‍රභේදයේ වසර පහක් (5) ඇතුළුව අවම වශයෙන් වසර දහයක (10) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**වැටුප් පරිමාණය :** මධ්‍යම කළමනාකාර මට්ටම - MM 1-1 - 2016 ශ්‍රේණිය I

**මාසික වැටුප :** ආසන්න වශයෙන් රු. 104,000/-

### සී. සහකාර අධ්‍යක්ෂ (අභ්‍යාස)

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ ප්‍රථම (විශේෂ) උපාධිය

  සහ

  පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ වෘත්තීය ආයතනයකින් ලබාගත් අභ්‍යාස හා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව

  සහ

  පිළිගත් රජයේ හෝ පෞද්ගලික අංශයේ කළමනාකරු - අභ්‍යාස හා සංවර්ධන වශයෙන් වසර හතරක (04) පළපුරුද්ද ඇතුළුව අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර හතක (07) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**වැටුප් පරිමාණය :** මධ්‍යම කළමනාකාර මට්ටම - MM 1-1 - 2016 ශ්‍රේණිය II

**මාසික වැටුප :** ආසන්න වශයෙන් රු. 77,000/-

### ඩී. සහකාර අධ්‍යක්ෂ - මානව සම්පත් (විමර්ශන)

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය හෝ නීතිය පිළිබඳ ප්‍රථම (විශේෂ) උපාධිය

  සහ

  පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ වෘත්තීය ආයතනයකින් පිරිස් කළමනාකරණය / මානව සම්පත් කළමනාකරණය / කාර්මික සබඳතා පිළිබඳ එක් (01) වසරක ඩිප්ලෝමාව

  සහ

  අදාළ ක්ෂේත්‍රයේ, කළමනාකරණ ප්‍රභේදයේ වසර හතරක් (04) ඇතුළුව අවම වශයෙන් වසර හතක (07) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

විනය කළමනාකරණය / පළපුරුද්ද පිළිබඳ සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවනු ඇත.

**වැටුප් පරිමාණය :** මධ්‍යම කළමනාකාර මට්ටම - MM 1 -1 - 2016 ශ්‍රේණිය II

**මාසික වැටුප :** ආසන්න වශයෙන් රු. 77,000/-

### ඊ. රහස්‍ය ලේකම්

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධියක්

  සහ

  පිළිගත් රාජ්‍ය / පෞද්ගලික ආයතනයක රහස්‍ය ලේකම් පරිචය පිළිබඳ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද

  හෝ

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් අනුමත පිළිගත් ආයතනයකින් ලබාගත් ලේකම් රාජකාරි පරිචය පිළිබඳ එක් වසරක ඩිප්ලෝමාව

  සහ

  පිළිගත් රාජ්‍ය / පෞද්ගලික ආයතනයක රහස්‍ය ලේකම් පරිචය පිළිබඳ අවම වශයෙන් මාස 08 ක පළපුරුද්ද

ශ්‍රී ලංකා වරලත් ලේකම්වරුන්ගේ සංගමයේ සාමාජිකත්වය අමතර සුදුසුකමක් වේ.

**වැටුප් පරිමාණය :** කනිෂ්ඨ කළමනාකාර මට්ටම - JM 1-1 - 2016 ශ්‍රේණිය II

**මාසික වැටුප :** ආසන්න වශයෙන් රු. 62,500/-

### 02. පොදු කොන්දේසි

අ) අයදුම්කරුවන් වයස අවුරුදු 45 ට අඩුවිය යුතුය. රාජ්‍ය / සංස්ථා සේවයේ අයදුම්කරුවන්ට වයස් සීමාව අදාළ නොවේ.

ආ) පත්වීම් ස්ථිර පදනම මත වේ.

ඇ) සේවක අර්ථ සාධක අරමුදල (15% ක දායකත්වය අධිකාරිය මගින්)

ඈ) සේවක භාරකාර අරමුදල (3% ක දායකත්වය අධිකාරිය මගින්)

### 03. අමතර ප්‍රතිලාභ

අ) නාගරික සංවර්ධන අධිකාරියේ ණය සහ ආපදා ණය යෝජනා ක්‍රම

ආ) වාර්ෂික ප්‍රසාද දීමනා

ඇ) ප්‍රයෝජනයට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම

ඈ) වෛද්‍ය රක්ෂණ

04. තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද මත වැටුප් පරිමාණයේ මූලික පියවරට ඉහළ වැටුප් තලයක පිහිටුවීම කෙරෙහි සලකා බලනු ඇත.

05. රාජ්‍ය / රාජ්‍ය සංස්ථා සේවාවන්හි නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු අතර, කලින් පිටපතක් සෘජුව යොමු කළ හැකිය.

06. අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර හා ජීව දත්ත සහිතව අදාළ සහතික වල පිටපත් සමග අයදුම්පත් දින 10 ක් ඇතුළත පහත ලිපිනයට යොමු කරන්න.

**සභාපති,**
**නාගරික සංවර්ධන අධිකාරිය,**
**09 වන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල.**